AL/2025/25 B/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

යුරෝපා ඉතිහාසය II (I කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி I)
History of Europe II (Part I)

**25 B** | **S** | **II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**විභාග අංකය:** ........................................

**උපදෙස්:**
- මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- **I කොටසෙහි 1- 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
- **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) ක්‍රීට (2) සයිප්‍රස් (3) අදියාතික් (4) කෝසිකා (5) එල්බා (...3...)

**2.** (1) බහුදේවවාදය (2) මානවවාදය (3) බුද්ධිවාදය (4) පුද්ගලවාදය (5) ලිබරල්වාදය (...1...)

**3.** (1) යුදෙව් ආගම (2) රෝමානු කතෝලික ආගම (3) ඉස්ලාම් ආගම (4) ප්‍රොතෙස්තාන්තවාදය (5) සියොන්වාදය (...5...)

**4.** (1) ඇනක්සිමැන්ඩර් (2) හොරස් (3) ඇනක්සිමිනීස් (4) පයිතගරස් (5) ආකිමිඩීස් (...2...)

**5.** (1) හෙරඩෝටස් (2) තුසිඩිඩීස් (3) නීරෝ (4) ලිවි (5) ටැසිටස් (...3...)

**6.** (1) මේරියස් (2) සුල්ලා (3) පොම්පේ (4) ජූලියස් සීසර් (5) කොන්ස්ටන්ටයින් (...5...)

**7.** (1) ටියුඩර් (2) රොමනොෆ් (3) ස්ටුවට් (4) හැනෝවර් (5) වින්ඩ්සර් (...2...)

**8.** (1) බේඩන් (2) වුටෙම්බර්ග් (3) බැවේරියා (4) ලොම්බාර්ඩි (5) හෙස (...4...)

**9.** (1) ඇඩම් ස්මිත් (2) ජෝර්ජ් කැනිං (3) පාමර්ස්ටන් සාමි (4) බෙන්ජමින් ඩිස්රායලි (5) විලියම් ග්ලැඩ්ස්ටන් (...1...)

10. (1) ජෝශෙප් ස්ටාලින් (2) මාර්ෂල් ටිටෝ (3) නිකිතා කෘෂ්චෙව්
(4) ඇලෙක්සි කොසිගින් (5) ලියොනිඩ් බ්‍රෙෂ්නෙව් (...2...)

● අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද **එකිනෙකට නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) හෝමර් - ග්‍රීක වීර කාව්‍ය රචකයා
(2) තේලීස් - ග්‍රීක දාර්ශනිකයෙක් හා විද්‍යාඥයෙක්
(3) හෙරක්ලිටස් - දර්ශනවාදයේ පියා
(4) හිපොක්‍රටීස් - වෛද්‍ය විද්‍යාවේ පියා
(5) පෙට්රාක් - මානවවාදයේ පියා (...3...)

12. (1) මහා ඇලෙක්සැන්ඩර් - මැසිඩෝනියාව
(2) චාලිමේන් - ෆ්‍රැන්ක් රාජධානිය
(3) මහා පීටර් - රුසියාව
(4) මහා ෆ්‍රෙඩ්රික් - ඔස්ට්‍රියාව
(5) වික්ටෝරියා රැජින - බ්‍රිතාන්‍යය (...4...)

13. (1) ජෝන් වයික්ලිෆ් - ඉංග්‍රීසි
(2) ජෝන් හස් - බොහිමියන්
(3) මාටින් ලූතර් - ජර්මන්
(4) උල්රිච් ස්වින්ලි - ස්විස්
(5) ජෝන් කැල්වින් - ඉතාලි (...5...)

14. (1) ජෝන් ලොක් - ව්‍යවස්ථානුකූල ආණ්ඩුක්‍රමය සාධාරණීකරණය කළේ ය.
(2) වෝල්ටෙයාර් - රජවරුන්ගේ දේවවරම්වාදී මතවාදයට සහාය දුන්නේ ය.
(3) මොන්ටෙස්කියු - බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කළේ ය.
(4) රූසෝ - මහජන ස්වාධිපත්‍යය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කළේ ය.
(5) කාල් මාක්ස් - ධනවාදයේ විනාශය හා සමාජවාදය පිහිටුවීම පිළිබඳ පුරෝකථනය කළේ ය. (...2...)

15. (1) අන්තර්ජාතික අධිකරණය (ICJ) - හේග්
(2) ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) - රෝමය
(3) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) - ජිනීවා
(4) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) - නිව්යෝර්ක් -( පැ, රිම් )
(5) අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF) - වොෂිංටන් (...4...)

● අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

| | X | | Y |
|---|---|---|---|
| 16. | (i) පර්සියන් යුද්ධ | A - | ඔස්ට්‍රියාවට හා ප්‍රංශයට එරෙහි ව ප්‍රශියාව හා බ්‍රිතාන්‍යය |
| | (ii) රෝස යුද්ධ | B - | ඔස්ට්‍රියාව සහ ප්‍රශියාව |
| | (iii) ක්‍රිමියානු යුද්ධය | C - | ලැන්කැස්ට්‍රියන්වරුන් හා යෝර්ක්වරුන් |
| | (iv) හත් අවුරුදු යුද්ධය | D - | ග්‍රීසිය හා පර්සියාව |
| | (v) සත් සති යුද්ධය | E - | තුර්කියට, බ්‍රිතාන්‍යයට හා ප්‍රංශයට එරෙහි ව රුසියාව |

(1) D C E A B (2) D C E B A (3) D E A B C (4) E A D C B (5) E D A C B (...1...)

අ.පො.ස (උසස් පෙළ) සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

| | X | | Y |
|---|---|---|---|
| **17.** | (i) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ | A - | "කුමාරයා කපටි මෙන් ම ගුණවරුන ද විය යුතු ය." |
| | (ii) මකියාවෙලි | B - | "නිර්ධන පන්තික ආඥාදායකත්වය" |
| | (iii) තොමස් හොබ්ස් | C - | "වැඩි ම සංඛ්‍යාවකට වැඩි ම යහපත" |
| | (iv) ජෙරමි බෙන්තම් | D - | "ලෙවියාතන්ගේ" ස්වරූපයෙන් යුතු පරමාධිකාරී පාලකයා |
| | (v) වී. අයි. ලෙනින් | E - | "සීසර්ට ලැබිය යුතු දේ සීසර්ටත් දෙවියන් වහන්සේට ලැබිය යුතු දේ දෙවියන් වහන්සේටත් ලබා දෙන්න." |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EADCB (5) EDACB (...4.....)

| | X | | Y |
|---|---|---|---|
| **18.** | (i) ශාන්ත ඔගස්ටින් | A - | මුග්ධත්වයේ අගය වැනීම (Praise of Folly) |
| | (ii) ශාන්ත තොමස් ඇක්වයිනාස් | B - | ක්‍රිස්තියානි ධර්මයේ සංස්ථා |
| | (iii) ඩෙසිඩේරියස් ඉරාස්මස් | C - | න්‍යායානුකූල නිගමන (කරුණු) අනුපත |
| | (iv) මාටින් ලූතර් | D - | සුම්මා තියොලොජිකා |
| | (v) ජෝන් කැල්වින් | E - | දෙවියන්ගේ නගරය |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EADCB (5) EDACB (...5....)

| | X | | Y |
|---|---|---|---|
| **19.** | (i) ඔලිවර් ක්‍රොම්වෙල් | A - | අමෙරිකා එක්සත් ජනපදයේ පළමුවන ජනාධිපතිවරයා |
| | (ii) රොබට් වෝල්පෝල් | B - | ජර්මනියේ පළමුවන අධිරාජයා |
| | (iii) ජෝර්ජ් වොෂිංටන් | C - | වයිමාර් සමූහාණ්ඩුවේ පළමුවන ජනාධිපතිවරයා |
| | (iv) I වන විලියම් | D - | එංගලන්ත පොදු රාජ්‍යයේ ආරක්ෂක (පාලක) |
| | (v) ෆ්‍රෙඩ්රික් ඊබට් | E - | එංගලන්තයේ පළමුවන අගමැතිවරයා |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EADCB (5) EDACB (...3.....)

| | X | | Y |
|---|---|---|---|
| **20.** | (i) ස්පාඤ්ඤය | A - | බ්‍රසල්ස් |
| | (ii) ඩෙන්මාර්කය | B - | කිව් |
| | (iii) ෆින්ලන්තය | C - | කෝපන්හේගන් |
| | (iv) රුමේනියාව | D - | මැඩ්රිඩ් |
| | (v) යුක්රේනය | E - | හෙල්සින්කි |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EADCB (5) EDACB (...1.....)

- අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ** මාතෘකාවට **නොගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. ග්‍රීක පෞර රාජ්‍ය**

(1) ග්‍රීක පෞර රාජ්‍යය "පෝලිස්" නමින් හඳුන්වන ලදී.
(2) වඩාත් කැපී පෙනෙන පෞර රාජ්‍ය වූයේ ස්පාටා සහ ඇතන්ස් ය.
(3) ඇතන්ස්හි සාජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් පැවතුණි.
(4) ක්‍රිස්තියානි දහම ග්‍රීක පෞර රාජ්‍යවල ආරම්භ විය.
(5) ඇතන්ස් සහ ස්පාටා අතර පැවති යුද්ධ පෙලොපොනීසියානු යුද්ධ ලෙස හැඳින්වේ. (...4....)

**22. පුරාණ රෝම දායාද**

(1) රාජාණ්ඩුව, සමූහාණ්ඩුව සහ අධිරාජ්‍යය බඳු විවිධ ආණ්ඩුක්‍රම
(2) රෝම නීති ක්‍රමය
(3) දැවැන්ත ගෘහනිර්මාණ
(4) මහාමාර්ග බඳු ඉංජිනේරු ශිල්පයේ ජයග්‍රහණ
(5) වැඩවසම් සමාජ-ආර්ථික ක්‍රමය (...5....)

23. ජාතික රාජ්‍යයක ප්‍රධාන අංග
   (1) ජාතික ඒකසත්භාවය
   (2) රජය අභිබවා පල්ලිය සතු වූ ආධිපත්‍යය
   (3) බලය සංකේන්ද්‍රණය කරන ලද ශක්තිමත් ආණ්ඩුව
   (4) ශක්තිමත් ස්ථාවර හමුදාව
   (5) පොදු භාෂාවක් සහ පිළිගත් දේශසීමා (...2...)

24. දාහතරවන ලුවී
   (1) 1643 සිට 1715 දක්වා ප්‍රංශයේ රජු ය.
   (2) පරමාධිකාරී පාලන ක්‍රමයක් පවත්වාගෙන ගියේ ය.
   (3) හියුගනෝවරුන්ට ආගමික නිදහස ප්‍රදානය කළේ ය.
   (4) "රාජ්‍යය නම් මම වෙමි" යනුවෙන් ප්‍රකාශ කළා යැයි සැලකේ.
   (5) වර්සායි මාලිගය ගොඩනැංවීය. (...3...)

25. කාර්මික විප්ලව සමයේ ප්‍රධාන නවෝත්පාදන
   (1) මුළං මෝල
   (2) දුවන නඩාව
   (3) ස්පිනිං ජෙනිය
   (4) ජල රාමුව
   (5) බලවේග රෙදි වියන යන්ත්‍රය (...1...)

• අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් .................... 1 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් .................... 2 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් .................... 3 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් .................... 4 ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........... 5 ද **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

26. පුරාණ රෝමවරුන්ගේ සංස්කෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) පුරාණ රෝම සංස්කෘතිය, ග්‍රීක සංස්කෘතියෙන් ආභාසය ලබා ඇත.
   (B) රෝම දේව මණ්ඩලයේ ප්‍රධානියා සියුස් විය.
   (C) රෝම අධිරාජ්‍යයේ නිල භාෂාව ලතින් භාෂාව විය.
   (D) ඇරිස්ටෝටල්ගේ "ඇකඩෙමිය" රෝමයේ ප්‍රධාන අධ්‍යාපන ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. (...2...)

27. මධ්‍යකාලීන විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) මධ්‍යකාලීන විශ්වවිද්‍යාල පුරාණ ග්‍රීක අධ්‍යාපන ආයතනවල ආභාසය යටතේ ආරම්භ විය.
   (B) කැතිඩ්‍රල් පාඨශාලා අතුරෙන් වඩාත් ජනප්‍රිය වෙමින් පැවති කිහිපයක් ආශ්‍රිත ව මධ්‍යකාලීන විශ්වවිද්‍යාල ආරම්භ විය.
   (C) ප්‍රසිද්ධියට පත් ආදිතම විශ්වවිද්‍යාල දෙක වූයේ බොලෝඤ්ඤා හා පැරිස් විශ්වවිද්‍යාලයි.
   (D) මධ්‍යකාලීන විශ්වවිද්‍යාලවල උගන්වන ලද ප්‍රධාන විෂයය ග්‍රීක දර්ශනය විය. (...3...)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

28. නැපෝලියන් බොනපාට් සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) 1804 සිට 1814 දක්වා ප්‍රංශයේ අධිරාජයා විය.
(B) "විප්ලවය යනු මම වෙමි" යනුවෙන් ප්‍රකාශ කළා යැයි සැලකේ.
(C) ප්‍රංශ නීති ක්‍රමය ප්‍රතිසංවිධානය කළේ ය.
(D) වෝටර්ලු සටනින් පරාජයට පත් විය.
(...5...)

29. ඉතාලිය එක්සත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ඉතාලිය එක්සත් කිරීම, පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජධානියේ කාර්යයක් විය.
(B) වික්ටර් එමැනුවෙල් එක්සත් ඉතාලියේ රජු බවට පත් විය.
(C) ගැරිබෝල්ඩි "තරුණ ඉතාලි සංගමය" පිහිටුවීය.
(D) 1870 දී මැසිනි ඉතාලියේ අගමැතිවරයා බවට පත් විය.
(...1...)

30. සෝවියට් දේශයේ බිඳවැටීම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ලෙනින්ගේ නව ආර්ථික ප්‍රතිපත්තිය සෝවියට් දේශයේ බිඳවැටීමට මඟ පෑදීය.
(B) ජෝසෆ් ස්ටාලින්ගේ ප්‍රතිපත්ති සෝවියට් දේශය දේශපාලන වශයෙන් අස්ථාවරභාවයට පත් කළේ ය.
(C) සෝවියට් දේශය එහි අවසාන දශක වන විට ආර්ථික ඇනහිටීමකට මුහුණ දී සිටියේ ය.
(D) මිහායිල් ගොර්බචොව්ගේ ප්‍රතිපත්ති සෝවියට් දේශයේ බිඳවැටීමට හේතු විය.
(...4...)

- අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. "සියල්ල මනින මිනුම් දණ්ඩ මිනිසා ය" යනුවෙන් ප්‍රකාශ කළ ග්‍රීක විතණ්ඩවාදියා (සොෆිස්ට්වරයා) කවුද?
(1) හෙරක්ලිටස් (2) ඩිමොක්‍රිටස් (3) ප්‍රොටගරස්
(4) ප්ලේටෝ (5) ගෝර්ජියාස්
(...3...)

32. ක්‍රිස්තු ධර්මය රෝම අධිරාජ්‍යයේ නිල ආගම බවට පත් කළ අධිරාජයා කවුද?
(1) ඩෙසියස් (2) ඩයොක්ලීෂියන් (3) ගැලේරියස්
(4) කරාකිලුස් (5) I වන තියොඩෝසියස්
(...5...)

33. 1498 දී කැලිකට් වරායට ගොඩබට පෘතුගීසි දේශගවේෂකයා කවුද?
(1) බර්තෝලමියු ඩියස් (2) වස්කෝ ද ගාමා (3) කබ්රාල්
(4) වස්කෝ ද බැල්බෝවා (5) ෆර්ඩිනන්ඩ් මැගලන්
(...2...)

34. රේඩියම් සොයාගත් පෝලන්ත ජාතික විද්‍යාඥයා කවුද?
(1) අයිසැක් නිව්ටන් (2) වික්ටර් හියුගෝ (3) ලුවී පාස්චර්
(4) මාරි කියුරි (5) වර්ජිනියා වුල්ෆ්
(...4...)

35. මුසෝලිනී විසින් ආක්‍රමණය කරන ලද අප්‍රිකානු රට කුමක් ද?
(1) ඇබිසීනියාව (2) ලිබියාව (3) ඇල්ජීරියාව
(4) ඊජිප්තුව (5) සුඩානය
(...1...)

● අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන තථ්ය ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | ඔගස්ටස් සීසර්ගේ පාලන සමයේ දී ජේසුස් වහන්සේ බෙත්ලෙහෙමෙහි උපත ලැබූහ. | ඉස්ලාම් ධර්මයේ ආදිකර්තෘවරයා වන මුහම්මද් නබිතුමා ක්‍රි.ව. 570 දී පමණ මක්කම දී උපත ලැබූහ. | (...2...) |
| 37. | ආගමික ප්‍රතිසංස්කරණය යුරෝපයේ එතෙක් පැවති ආගමික තත්ත්වයේ පරිවර්තනයක් සනිටුහන් කළේ ය. | මධ්‍යකාලීන ආගමික දෘෂ්ටි පථයෙන් ඉවත් වූ ආගමික ප්‍රතිසංස්කරණය, මධ්‍යතන යුගයේ පැවති ආගමික ඒකාබද්ධතාව අවසන් කළේ ය. | (...5...) |
| 38. | ලුවී පිලිප් හා මෙටර්නික් 1848 දී ප්‍රංශයේ හා ඔස්ට්‍රියාවේ විප්ලව මෙහෙය වූහ. | ජාතීන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු වූයේ සාමූහික ආරක්ෂාව මගින් ලෝක සාමය පවත්වාගෙන යාම සහ ජාත්‍යන්තර සහයෝගිතාව දිරිමත් කිරීමයි. | (...4...) |
| 39. | ඉතාලිය විසින් ලැටරන් ගිවිසුම මගින් වතිකානු නගරය ස්වෛරී රාජ්‍යයක් ලෙසත්, කතෝලික ආගම ඉතාලියේ නිල රාජ්‍ය ආගම ලෙසත්, පිළිගනු ලැබී ය. | දෙවන ලෝක යුද්ධය අවසන් වීමෙන් පසු ඉතාලියෙහි වයිමාර් සමූහාණ්ඩුව පිහිටුවන ලදී. | (...1...) |
| 40. | වෝර්සෝ සම්මුතිය යනු යුරෝපීය හා උතුරු ඇමෙරිකානු රාජ්‍ය අන්‍යෝන්‍ය ආරක්ෂාව හා යුද්ධ ආධාර [illegible] පර අත්සන් කරන ලද ගිවිසුමකි. | න්‍යෂ්ටික යුද්ධයක් වළක්වා ගැනීමට නම් බටහිර රටවල් සමග සාමකාමී සහජීවන ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍ය යැයි ජෝසෆ් ස්ටාලින් යෝජනා කළේ ය. | (...3...) |

* *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

යුරෝපා ඉතිහාසය II (II කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

**25 B** **S** **II**

යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

උපදෙස්:
- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- II කොටස A, B හා C ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- B හා C **කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) ඊජියන් මුහුද (ii) ටයිබර් ගඟ (iii) සයිප්‍රස්
(iv) කොන්ස්තන්තිනෝපලය (v) කැස්පියන් මුහුද (vi) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය
(vii) ලිස්බන් (viii) ස්කොට්ලන්තය (ix) සේන් ගඟ
(x) පෝලන්තය (xi) ලෙනින්ග්‍රෑඩ් (xii) යාල්ටා

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

## B කොටස

2. පහත සඳහන් ක්ෂේත්‍රවල පුරාණ ග්‍රීකයන්ගේ ප්‍රධාන කාර්ය සාධනයන් සාකච්ඡා කරන්න.
(i) කලාව සහ ගෘහනිර්මාණ ශිල්පය
(ii) සාහිත්‍යය හා දර්ශනය (ලකුණු 16 යි)

3. "පුනරුදය යුරෝපයෙහි නූතනත්වයේ උපත සලකුණු කරයි."
(i) "පුනරුදය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)
(ii) පුනරුද කලාකරුවන්ට අනුග්‍රහ දැක්වූ **ප්‍රකට පවුලක්** සහ **පාප්වරයෙක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) පුනරුද කලාකරුවන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02 යි)
(iv) කලාව හා විද්‍යාව යන ක්ෂේත්‍රවල ඇතිවූ වර්ධනයන් ඇසුරෙන් පුනරුදය යුරෝපයෙහි නූතනත්වයේ උපත සලකුණු කරන ලද ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

4. ප්‍රංශ විප්ලවය ඇතිවීමට තුඩු දුන් දේශපාලන හා සමාජ-ආර්ථික සාධක විග්‍රහ කරන්න. (ලකුණු 16 යි)

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(i) බටහිර රෝම අධිරාජ්‍යයට එල්ල වූ මලේච්ඡ ආක්‍රමණ
(ii) ස්පාඤ්ඤයන් නිරත වූ දේශ ගවේෂණ
(iii) එංගලන්තයේ කැබිනට් ක්‍රමයේ වර්ධනය
(iv) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම (ලකුණු 08 × 2 = 16 යි)

[ පෙරළා බලන්න

## C කොටස

6. (i) වියානා සම්මේලනයේ ප්‍රධාන අරමුණු විස්තර කරන්න. (ලකුණු 07 යි)
(ii) වියානා සම්මේලනය විසින් ගනු ලැබූ ප්‍රධාන තීරණ විග්‍රහ කරන්න. (ලකුණු 09 යි)

7. "ප්‍රශියානු බලය ජර්මන් රාජ්‍ය පුරා ව්‍යාප්ත කිරීමෙන් ජර්මනිය නිර්මාණය කරන ලදී."
(i) 1834 දී ප්‍රශියානු නායකත්වය යටතේ පිහිටුවන ලද තීරු බදු සංගමය නම් කරන්න. (ලකුණු 01 යි)
(ii) ස්වකීය නායකත්වය යටතේ ජර්මනිය එක්සත් කරන ලද ප්‍රශියානු නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)
(iii) 1815 සිට 1848 දක්වා කාලය තුළ ජර්මනිය එක්සත් කිරීමට එරෙහි ව තිබූ බාධක **දෙකක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
(iv) එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ජර්මනිය එක්සත් කිරීමෙහිලා ප්‍රශියාව ඉටුකළ කාර්යභාරය විචාරාත්මක ව විමසන්න. (ලකුණු 10 යි)

8. (i) "නිරවි යුද්ධය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි නිර්වචනය කොට, එය ඇති වූ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 07 යි)
(ii) 1962 තෙක් නිරවි යුද්ධය ජාත්‍යන්තර දේශපාලනය කෙරෙහි බලපෑවේ කෙසේ දැ'යි සාකච්ඡා කරන්න. (ලකුණු 09 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(i) නැපෝලියන් බොනපාට්ගේ විදේශ ප්‍රතිපත්තිය
(ii) බොල්ශෙවික් විප්ලවය
(iii) ඉතාලියේ ෆැසිස්ට්වාදය
(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) සාහිත්‍යය හා දර්ශනය

❖ <u>සාහිත්‍යය</u>

- වීර කාව්‍ය - හෝමර්ගේ ඉලියඩ් හා ඔඩිසි
- ගී කාව්‍ය - පින්ඩාර්ගේ හා සැෆෝගේ නිර්මාණ
- නාට්‍ය
  - ✓ ශෝකාන්ත - ඊස්කිලස්ගේ (පර්සියන්ස් /ඔරෙස්ටියා ත්‍රිත්වය / ප්‍රොමිතියස් බන්ධනය), සොෆොක්ලීස්ගේ (ඊඩිපස් රෙක්ස් / ඇන්ටිගනී / ඉලෙක්ට්‍රා) හා යුරිපිඩීස්ගේ (ට්‍රෝජන් කාන්තාවෝ / මීඩියා / ද බැකී / ඇල්සෙස්ටිස්) නිර්මාණ.
  - ✓ සුඛාන්ත (ප්‍රහසන) - ඇරිස්ටොෆනීස්ගේ (ද ෆ්‍රොග්ස් / ද ක්ලවුඩ්ස් / ලයිසිස්ට්‍රාටා) නිර්මාණ.
- ඉතිහාස කෘති - හෙරඩෝටස් (පර්සියානු යුද්ධය), තුසිඩිඩීස් (පෙලපොනීසියානු යුද්ධ)
- උපමා කථා - හෙසියඩ්ගේ වැඩ හා දවස් / ඊසොප්ගේ උපමා කථා

❖ <u>දර්ශනය</u>

- එකල ඉතාමත්ම වැදගත් විෂය ක්ෂේත්‍රය සේ සැලකිණ.
- එකල දර්ශනය නම් විෂය ක්ෂේත්‍රයට භෞතික විද්‍යාව, තාරකා විද්‍යාව, තර්ක ශාස්ත්‍රය ආදිය අයත් විය.
- ග්‍රීක දර්ශනයේ විශේෂ ලක්ෂණය - තර්කානුකූලව හා බුද්ධිවාදී ලෙස ස්වභාව ධර්මය හා මානව සමාජය අධ්‍යයනය කිරීමට උත්සාහ කිරීමයි.
- මුල්කාලීන දාර්ශනිකයන් - තේලීස්, ඇනෙක්සිමැන්ඩර්, ඇනෙක්සිමිනීස්.
- විතණ්ඩවාදීන් (සොෆිස්ට්ස්).
- සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්.

(ලකුණු 16 යි)

3. "පුනරුදය යුරෝපයෙහි නූතනත්වයේ උපත සලකුණු කරයි."
   (i) "පුනරුදය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි නිර්වචනය කරන්න.

වචනාර්ථය - යළි ඉපදීම

ඉපැරණි ග්‍රීක - රෝම භාෂා, සාහිත්‍යය හා සංස්කෘතිය යළි පිබිදීම.

මානවවාදයේ නැගීම. (ලකුණු 02 යි)


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) පුනරුද කලාකරුවන්ට අනුග්‍රහ දැක්වූ ප්‍රකට පවුලක් සහ පාප්වරයෙක් නම් කරන්න.

පවුල් - ෆ්ලොරන්ස්හි මෙඩිචි, මිලාන්හි ස්ෆෝසා, මන්ටුවාහි ගොන්සාගා, ෆෙරාරාහි එස්ටේ
පාප්වරුන් - IV නිකලස්, VI ඇලෙක්සැන්ඩර්, II ජුලියස්, X ලියෝ

(ලකුණු 02 යි)

(iii) පුනරුද කලාකරුවන් දෙදෙනකු නම් කරන්න.

ලියනාඩෝ ඩා වින්චි / මයිකලාංජලෝ / රෆායල් / ටිටියන් / බොටිචෙලි / ඩොනෙටෙලෝ / ජියොටෝ / මසත්චියෝ

(ලකුණු 02 යි)

(iv) කලාව හා විද්‍යාව යන ක්ෂේත්‍රවල ඇතිවූ වර්ධනයන් ඇසුරෙන් පුනරුද යුරෝපයෙහි නූතනත්වයේ උපත සලකුණු කරන ලද ආකාරය පරීක්ෂා කරන්න.

- ග්‍රීක හා ලතින් භාෂාවල ප්‍රබෝධයක් ඇතිවීම, භාෂා සහ මානවශාස්ත්‍ර හැදෑරීම වර්ධනය වීම. මානවවාදයේ නැගී ඒම.
- කලාව: ගෘහනිර්මාණ ශිල්පය, ප්‍රතිමා කලාව ග්‍රීක-රෝම සම්ප්‍රදායන්ගේ ආභාෂය ලැබීම; චිත්‍ර කලාවේ විශාල ප්‍රබෝධයක් ඇතිවීම; ස්වභාවිකත්වයට හා ලෞකිකත්වයට නැඹුරුවීම.

  පුනරුද කලාකරුවන්ගේ කෘතීන් උදා: ලියනාඩෝ ඩා වින්චිගේ මොනාලිසා, මයිකලාංජලෝගේ ඩේවිඩ්.

- විද්‍යාව: මානවවාදය සහ තර්ක බුද්ධියෙහි වැදගත්කම අවධාරණය කිරීම නිසා විද්‍යාවෙහි ප්‍රබෝධයක් ඇතැවීම; නිකලස් කොපර්නිකස්, ගැලිලියෝ ගැලිලි, ජොහැන්නස් කෙප්ලර්, විලියම් හාවේ, පැරසෙල්සස් ආදීන්ගේ සොයාගැනීම්.

  මේ අනුව ලෞකික කලාව, විද්‍යාවේ වර්ධනය ආදිය පෙන්නුම් කොටගෙන යුරෝපයේ කැපී පෙනෙන වර්ධනයක් හටගැනීම.

(ලකුණු 10 යි)

4. ප්‍රංශ විප්ලවය ඇතිවීමට තුඩු දුන් දේශපාලන හා සමාජ-ආර්ථික සාධක විග්‍රහ කරන්න.

- **දේශපාලන:** බලය කේන්ද්‍රගත කරන ලද ඒකාධිපති රාජාණ්ඩුව; රිචලියු හා මැසරින් රදළයන් සතු ප්‍රාදේශීය බලය ඔවුන් වෙතින් ඉවත් කොට කිරීටය වෙත පැවරීමටත්, මධ්‍යම ආණ්ඩුව වෙත පරිපාලනය කේන්ද්‍රගත කිරීමටත් පියවර ගැනීම; විප්ලවාසන්න සමයේ පැවති අකාර්යක්ෂම පරිපාලනය; අමෙරිකානු නිදහස් සටනේ බලපෑම.

ස්ටේට් ජෙනරල් සභාව විසුරුවා හැරීම

- ❖ **ආර්ථික:** කෘෂිකර්මාන්තය පදනම් කරගත් වැඩවසම් සම්බන්ධතා මත සංවිධානය වූ ආර්ථිකය; වෙළඳාම පුළුල් වී තිබූ, එහි වර්ධනයට අහිතකර තත්ත්වයන් පැවතීම (දූෂිත පරිපාලනය, බදු); විප්ලවාසන්න සමයේ ඇතිවී තිබූ මූල්‍ය අර්බුදය.

- ❖ **සමාජ:** ප්‍රංශ සමාජය ප්‍රජා ගණ තුනකින් සමන්විත වීම - පූජකයන්, රදළයන් හා සාමාන්‍ය ජනතාව (මධ්‍යම පන්තිය, ගොවි ජනතාව හා නාගරික කම්කරුවන්); මෙම සමාජ කොටස් මුහුණ දුන් විවිධ ප්‍රශ්න හා ඔවුන්ගේ දුක්ගැනවිලි; විශේෂයෙන් සාමාන්‍ය ජනතාවගේ දුක් ගැනවිලි ප්‍රංශ විප්ලවය ඇතිවීම කෙරෙහි බලපෑම. පූර්ව විප්ලවීය ප්‍රංශයේ ජීවත් වූ දාර්ශනිකයන් (වොල්ටෙයාර්, මොන්ටෙස්කියු හා රූසෝ) හා ඔවුන්ගේ අදහස් මධ්‍යම පංතිය කෙරෙහි ඇතිකළ බලපෑම.

(ලකුණු 16 යි)

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) බටහිර රෝම අධිරාජ්‍යයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණ
   (ii) ස්පාඤ්ඤයන් නිරත වූ දේශ ගවේෂණ
   (iii) එංගලන්තයේ කැබිනට් ක්‍රමයේ වර්ධනය
   (iv) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම

(ලකුණු 08 × 2 = 16 යි)

## (i) බටහිර රෝම අධිරාජ්‍යයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණ

- ❖ ම්ලේච්ඡයන් යනු රෝම අධිරාජ්‍ය සීමාවෙන් පිටත රයින් සහ ඩැනියුබ් ගංගාවලින් ඔබ්බෙහි ජීවත් වූ ගෝත්‍ර වේ.
- ❖ රෝම වැසියන් තරම් සංස්කෘතික වශයෙන් දියුණු ජන කොට්ඨාශයක් නොවූ බැවින් රෝමවරුන් විසින් මොවුන් 'ම්ලේච්ඡයන්' ලෙස සලකනු ලැබිය.
- ❖ මුලදී මිතුරන් ලෙසත් පසුව ආක්‍රමණිකයන් ලෙසත් අධිරාජ්‍යයට ඇතුළු වූහ.
- ❖ ඒ ඒ ගෝත්‍ර කඩාවැදුණු රෝම අධිරාජ්‍යයේ ප්‍රදේශ මෙසේය:

| ගෝත්‍රය | ප්‍රදේශ/ය |
|---|---|
| විසිගොත් | ස්පාඤ්ඤය, මැසිඩෝනියාව, ඉතාලිය |
| ඔස්ට්‍රොගොත් | ඉතාලිය |
| ෆ්‍රෑන්ක් | ගෝල් දේශය |
| වැන්ඩල් | ස්පාඤ්ඤය, උතුරු අප්‍රිකාව, ඉතාලිය |
| ලොම්බාඩ් | ඉතාලිය |
| ඇංග්ලො-සැක්සන් | බ්‍රිතාන්‍යය |

අභ්‍යන්තර වශයෙන් පරිහානියට පත්ව තිබියෙදී බටහිර රෝම අධිරාජ්‍යයට බාහිරින් එල්ල වූ ඉහත ම්ලේච්ඡ ආක්‍රමණ හේතු කොටගෙන එය බිඳවැටිණි.

(ලකුණු 08 යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙබ් අඩවියට පිවිසෙන්න

**(ii) ස්පාඤ්ඤයන් නිරත වූ දේශ ගවේෂණ**

- ❖ ක්‍රිස්ටෝෆර් කොළම්බස් - කැරිබියන් දූපත්වලට ගොඩබැසීම
- ❖ අමෙරිගෝ වෙස්පූචි - අමෙරිකා මහද්වීපයට ගොඩ බැසීම
- ❖ ෆර්ඩිනන්ඩ් මැගලන් - ලොව වටා යාත්‍රා කිරීම
- ❖ හර්නැන්ඩෝ කෝර්ටීස් - මෙක්සිකෝව ජයගැනීම
- ❖ ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ - පේරු දේශය ජයගැනීම
- ❖ මැගලන්ගේ නාවික ගමනින් පසු ස්පාඤ්ඤයන් පිලිපීන දූපත්වල සිය ආධිපත්‍යය පිහිටුවීමට පෙළඹීම.

**(ලකුණු 08 යි)**

**(iii) එංගලන්තයේ කැබිනට් ක්‍රමයේ වර්ධනය**

- ❖ වර්තමාන කැබිනට් ක්‍රමයේ වර්ධනය සිදුවූයේ 1688 විප්ලවයෙන් පසුවය.
  - ▪ රජුගේ බලතල ව්‍යවස්ථාවෙන්ම සීමා කිරීම
  - ▪ හැනෝවර් පරපුරේ මුල් රජවරුන් දෙදෙනාටම ඉංග්‍රීසි කථා කළ නොහැකිවීම නිසා එදිනෙදා කටයුතු මෙහෙයවීමේදී ඇමති මණ්ඩලය වඩාත් මැදිහත් වීම හේතු කොටගෙන කැබිනට් ක්‍රමය වර්ධනය විය.
- ❖ කැබිනට් ක්‍රමය වර්ධනය වීමත් සමග රජු ඇමති මණ්ඩලයේ මුලසුන ගැනීම අතහැර දැමීම.
- ❖ එහි ප්‍රතිඵලයක් වශයෙන් අගමැති තනතුර බිහිවීම (මණ්ඩලයේ මුලසුන ගැනීම, එහි තීරණ රජුට දැනුම් දීම, රජුගේ ප්‍රතිපත්ති සාකච්ඡා කොට තීරණයක් ගැනීම සඳහා මණ්ඩලයට ඉදිරිපත් කිරීම වැනි කාර්යයන් ඉටු කිරීමට අයෙකු අවශ්‍ය වීම නිසා).
- ❖ ප්‍රථම අගමැති ලෙස සලකනු ලබන්නේ රොබට් වොල්පෝල්ය.
- ❖ දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්ධනයත් සමග කැබිනට් මණ්ඩලයට එකම පක්ෂයකින් මන්ත්‍රීවරුන් තෝරාගැනීම සිදුවීම.
- ❖ රජුට මෙන්ම පාර්ලිමේන්තුවේ සෙසු මන්ත්‍රීවරුන්ටද පිළිතුරු බැඳීමට සිදුවීමත් සමග කැබිනට් ඇමතිවරුන් අතර සාමූහික වගකීමේ මූලධර්මය වර්ධනය වීම.
- ❖ ක්‍රමයෙන් අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය සත්‍ය විධායකය දක්වා වර්ධනය වීම.

**(ලකුණු 08 යි)**

(iv) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම

- තිස් අවුරුදු යුද්ධය අවසන 1648 දී III ෆර්ඩිනන්ඩ් අධිරාජයා මෙම ගිවිසුමට අත්සන් තැබීම.
- යුරෝපයේ ආගමික යුද්ධ අවසන් කිරීමට හේතුවීම.
- යුරෝපය තුළ දීර්ඝකාලීන සාමය ඇතිකිරීම අරමුණු කරගත් මුල්ම ප්‍රයත්නයක් වීම.
- ශුද්ධ රෝම අධිරාජයා යන තනතුර නාමික එකක් බවට පත්වීම.
- පාප් වහන්සේගේ බලය තවදුරටත් පිරිහීම.
- ජර්මන් කුමාර පාලකයන් බලවත් වීම හා ඒ හේතුකොටගෙන ජර්මනිය එක්සත් කිරීම තවදුරටත් පමා වීම.
- ප්‍රදේශ හිමිවීම හේතුකොටගෙන ප්‍රංශය වඩාත් බලවත් වීම.
- ස්වීඩනයට බෝල්ටික් මුහුදේ වෙළඳ ආධිපත්‍යය හිමිවීම.
- 1555 ඔග්ස්බර්ග් සම්මුතිය මගින් කතෝලිකයන්ට හා ලූතර්වාදීන්ට ලබාදී තිබූ අයිතිවාසිකම් මෙමගින් කැල්වින්වාදීන්ටද ලබාදීම.
- ස්විට්සර්ලන්තය හා නෙදර්ලන්තය නිදහස් රාජ්‍යයන් වීම.
- නූතන යුරෝපා රාජ්‍ය ක්‍රමයේ ආරම්භය සලකුණු කළක් ලෙස සැලකේ.

8

(ලකුණු 16 යි)

C කොටස

6. (i) වියානා සම්මේලනයේ ප්‍රධාන අරමුණු විස්තර කරන්න.

- නැපෝලියන් බොනපාට් පරාජය කිරීමෙන් පසුව යුරෝපා බලවතුන් වියානාවේදී රැස් වූ සම්මේලනය මේ නමින් හැඳින්වීම.
- අරමුණු:
  - නැපෝලියන් විසින් අවුල්කරන ලදැයි සැලකුණ යුරෝපා සිතියම යළි සකස්කිරීම.
  - ප්‍රංශ විප්ලවය ඇතිවීමට පෙර පැවති රජ පෙළපත් හා දේශසීමා නැවත ඇතිකිරීම (නීත්‍යානුකූලවාදය).
  - බාධක රාජ්‍ය ඇති කිරීම හා බලසමතුලිතතාව.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) වියානා සම්මේලනය විසින් ගනු ලැබූ ප්‍රධාන තීරණ විග්‍රහ කරන්න.

❖ <u>තීරණ</u>

- ප්‍රංශයේ දේශසීමා, 1789 ට පෙර පැවති තත්ත්වයට ගෙන ඒම. බූර්බෝන් රාජවංශය යළි බලයේ පිහිටුවීම.
- ජර්මනිය තුළ, පෙර පැවති 360 කට අධික රාජ්‍ය කොටස් සංඛ්‍යාව රාජ්‍ය කොටස් 39 වශයෙන් ප්‍රතිසංවිධානය කිරීම. ජර්මන් සංයුක්තය පිහිටුවීම හා එහි නායකත්වය ඔස්ට්‍රියාවට ලබාදීම.
- ජර්මානු ප්‍රදේශ තුළ ඔස්ට්‍රියාව හා ප්‍රශියාව අතර බලසමතුලිතතාවක් ඇති කිරීම. ඔස්ට්‍රියාවට ලොම්බාඩි හා වෙනීසියා ලබාදීම හා ප්‍රශියාවට අමතර ප්‍රදේශ ලබාදීම (සැක්සනිය හා වෙනත් ප්‍රදේශ).
- ඉතාලිය - නිත්‍යානුකූලවාදය තදින්ම ක්‍රියාත්මක වූයේ ඉතාලියේය. ලොම්බාඩිය, වෙනීසියාව, පීඩ්මොන්ට්-සාර්ඩීනියා, පර්මා, මොඩීනා, ටස්කනි, පාප් රාජ්‍යය, නේපල්ස් හා සිසිලි යනුවෙන් ඉතාලිය කොටස් කර ඒවායේ පැරණි රාජවංශ යළි පිහිටුවීම.
- ඕලන්දය හා බෙල්ජියම ඒකාබද්ධ කිරීම.

යුරෝපා බලවතුන්ගේ අභිමතාර්ථ අනුව ප්‍රදේශ බෙදාගැනීම; ප්‍රංශය වටා බාධක රාජ්‍ය පිහිටුවීමේදී ප්‍රශියාවට ලැබුණු ප්‍රදේශ හේතු කොටගෙන ජර්මානු රාජ්‍ය අතර ප්‍රබලයා බවට පත්වීමට මගපෑදීම; ඉතාලිය තවදුරටත් බෙදුණු රටක් වීම ආදී වූ කරුණු දක්වමින් තීරණ විග්‍රහ කොට තිබීම පිළිතුරෙන් අපේක්ෂිතය.

7. "ප්‍රශියානු බලය ජර්මන් රාජ්‍ය පුරා ව්‍යාප්ත කිරීමෙන් ජර්මනිය නිර්මාණය කරන ලදී."

(i) 1834 දී ප්‍රශියානු නායකත්වය යටතේ පිහිටුවන ලද තීරු බදු සංගමය නම් කරන්න.

සොල්වරයින් **(ලකුණු 01 යි)**

(ii) ස්වකීය නායකත්වය යටතේ ජර්මනිය එක්සත් කරන ලද ප්‍රශියානු නායකයා නම් කරන්න.

ඔටෝ ෆොන් <u>බිස්මාක්</u> **(ලකුණු 01 යි)**

(iii) 1815 සිට 1848 දක්වා කාලය තුළ ජර්මනිය එක්සත් කිරීමට එරෙහි ව තිබූ බාධක **දෙකක්** කෙටියෙන් දක්වන්න.

❖ රාජ්‍ය කොටස් 39 කට බෙදී පැවතීම.
❖ ඔස්ට්‍රියානු බලය හා බලපෑම.
❖ මෙටර්නික් ක්‍රමය.
❖ වියානා සම්මේලනයේ තීරණ ක්‍රියාත්මක කිරීමට යුරෝපා රටවල් බැඳී සිටීම.
❖ එක්සත්භාවය පිළිබඳ ජාතිකවාදී සංකල්පය ප්‍රමාණවත් ලෙස ප්‍රචලිතව නොතිබීම.
❖ ජර්මනිය එක්සේසත් කිරීම සඳහා තනි වැඩපිළිවෙලක් වෙනුවට විවිධ ක්‍රියාමාර්ග ඉදිරිපත්වීම.

**(ලකුණු 04 යි)**

(iv) එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ජර්මනිය එක්සත් කිරීමෙහිලා ප්‍රශියාව ඉටුකළ කාර්යභාරය විචාරාත්මක ව විමසන්න.

- ❖ ජර්මනිය එක්සත් වීම සාර්ථක වූයේ ප්‍රශියාවේ නායකත්වයෙනි.
- ❖ 1834 ප්‍රශියාවේ මූලිකත්වයෙන් පිහිටුවන ලද සොල්වරයින් හිරුබඳු සංගමය මගින් ජර්මන් රාජ්‍ය අතර ආර්ථික එකමුතු බවක් ඇති කිරීම.
- ❖ එමගින් දේශපාලන එක්සත්භාවයකට පදනම දැමීම.
- ❖ 1862 බිස්මාක් ප්‍රශියාවේ චාන්සලර් තනතුරට පත්වීම. ඔහු ප්‍රශියාවේ නායකත්වය යටතේ ප්‍රශියානු බලය ජර්මනිය පුරා ව්‍යාප්ත කොට ජර්මනිය එක්සත් කිරීමට අධිෂ්ඨාන කරගෙන සිටීම.
- ❖ ඔහු විසින් ප්‍රශියානු හමුදාව ශක්තිමත් කිරීම.
- ❖ පහත සඳහන් අවස්ථා හා සිදුවීම් විග්‍රහ කරමින් ජර්මනිය එක්සත් කිරීමෙහිලා ප්‍රශියාව විසින් ඉටු කරන ලද කාර්යභාරය පරීක්ෂා කළ යුතුය.

1864: ෂ්ලෙස්විග් හා හොල්ස්ටයින් මුල්කරගෙන ඔස්ට්‍රියාව ප්‍රශියාව විසින් ඩෙන්මාර්කය පරාජය කරනු ලැබීය.

1866: ඔස්ට්‍රියාව හා ප්‍රශියාව අතර ඇති වූ සත් සති යුද්ධය; ප්‍රශියාව ජර්මනියේ ප්‍රමුඛ හා ශක්තිමත්ම බලවේගය ලෙස ඉස්මතු වීම; ප්‍රශියානු නායකත්වය යටතේ උතුරු ජර්මන් සංයුක්තය පිහිටුවීම.

1870-71: ප්‍රංශ-ප්‍රශියානු යුද්ධය; දකුණු ජර්මන් රාජ්‍ය උතුරු ජර්මන් සංයුක්තියට ඇදා ගැනීම; එක්සත් ජර්මනියක් බිහිවීම; එතැන් පටන් එය ජර්මන් අධිරාජ්‍යය වශයෙන් ක්‍රියාත්මක වීම.

(ලකුණු 10 යි)

8. (i) "නිරවි යුද්ධය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි නිර්වචනය කොට, එය ඇති වූ ආකාරය සැකෙවින් දක්වන්න.

**"නිරවි යුද්ධය" යන්නෙන් අදහස් කරන්නේ:**

- ❖ නිරවි යුද්ධය යනු දෙවන ලෝක යුද්ධයෙන් පසු අමෙරිකා එක්සත් ජනපදය ප්‍රධානකොට ගත් බටහිර (ධනවාදී) කඳවුර සහ සෝවියට් දේශය ප්‍රධානකොට ගත් නැගෙනහිර යුරෝපා රටවල්වලින් සමන්විත සමාජවාදී කඳවුර අතර ඇති වූ දෘෂ්ටිවාදීමය, දේශපාලන හා රාජ්‍යතාන්ත්‍රික ගැටුමයි.
- ❖ මෙකී දෙපිළ අතර මුහුණට මුහුණලා යුධ කිරීමක් සිදු නොවූ නමුත් යුද්ධාසන්න තත්ත්වයන් අවස්ථා ගණනාවකදී මතුවිය.
- ❖ බොහෝවිට සිදු වූයේ යුරෝපයෙන් පිටතදී හටගත් අවි ගැටුම්වලට මෙම කඳවුරු මැදිහත් වීමයි.
- ❖ සාමාන්‍යයෙන් දෙවන ලෝක යුද්ධයේ අවසාන අවධියේ මෙය ආරම්භ වූ බව සැලකේ.
- ❖ 1991 සෝවියට් දේශය බිඳවැටීම තෙක් පැවතිණි.

(ලකුණු 07 යි)


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) 1962 තෙක් සීතල යුද්ධය ජාත්‍යන්තර දේශපාලනය කෙරෙහි බලපෑවේ කෙසේ දැ'යි සාකච්ඡා කරන්න.

- ❖ සෝවියට් රුසියාව කොමියුනිස්ට්වාදය ව්‍යාප්ත කරන බවට බටහිර බලවතුන් චෝදනා කිරීම ('යකඩ තිරය' - චර්චිල්ගේ කථාව)
- ❖ එනිසා ව්‍යාප්තිය වළක්වාලීමේ ප්‍රතිපත්තියකට බටහිර කඳවුර යොමුවීම (containment policy).
    - ග්‍රීක සිවිල් අරගලය අවස්ථාවේ මැදිහත්වීම.
    - ට්‍රූමන් න්‍යාය
    - මාර්ෂල් සැලැස්ම
- ❖ යුධ සංවිධාන - NATO සහ WARSAW
- ❖ සෝවියට් රුසියාව විසින් කොමින්ෆෝම් වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම.
- ❖ 1948-58 බර්ලින් අර්බුදය.
- ❖ 1950 කොරියන් අර්බුදය.
- ❖ හංගේරියානු අර්බුදය.
- ❖ 1960 න් ඇරඹි කොංගෝ අර්බුදය.
- ❖ 1962 කියුබන් මිසයිල අර්බුදය

(ලකුණු 09 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) නැපෝලියන් බොනපාට්ගේ විදේශ ප්‍රතිපත්තිය
   (ii) බොල්ෂෙවික් විප්ලවය
   (iii) ඉතාලියේ ෆැසිස්ට්වාදය
   (iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය

(ලකුණු 08 × 2 = 16 යි)

**(i) නැපෝලියන් බොනපාට්ගේ විදේශ ප්‍රතිපත්තිය**

- ❖ ප්‍රංශය මුල්කොටගත් අධිරාජ්‍යයක් ගොඩනැංවීම සහ ප්‍රංශ විප්ලවයේ ඇතැම් අරමුණු පතුරුවාලීමේ අදහසින් නැපෝලියන් විදේශ රටවල් ආක්‍රමණය කිරීම.
- ❖ ප්‍රංශ බලය ව්‍යාප්ත වීම - ඇතැම් ප්‍රදේශ සෘජු ආධිපත්‍යයට නතු කරගැනීම හා තවත් ප්‍රදේශ ප්‍රංශයට අවනත රාජ්‍ය කරගැනීම.
- ❖ මේ ආක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස යුරෝපා දේශපාලන සිතියමේ පුළුල් වෙනසක් ඇති කිරීම - ඉතාලිය, ජර්මනිය.
- ❖ නැපෝලියන්ගේ ව්‍යාප්තවාදී ප්‍රතිපත්තිය හේතුකොටගෙන සෙසු යුරෝපා බලවතුන් ප්‍රංශ විරෝධී යුධ සන්ධාන ඇතිකරගෙන ප්‍රංශයට එරෙහිව සටන් කිරීම.
- ❖ එංගලන්තය ආර්ථික වශයෙන් දුර්වල කරගැනීම අරමුණු කරගෙන 'මහද්වීපික ක්‍රමය' ක්‍රියාත්මක කිරීම.
- ❖ මහද්වීපික ක්‍රමය අසාර්ථක වීම, අර්ධද්වීපික යුද්ධය හා අසාර්ථක රුසියානු ආක්‍රමණය මොහුගේ විදේශ ප්‍රතිපත්තියේ දුර්වල අවස්ථා වශයෙන් සැලකෙන අතර ඒවා ඔහුගේ පරිහානියට හේතු විය.
- ❖ අවසාන ප්‍රංශ විරෝධී යුධ සන්ධානයේ ප්‍රහාර හමුවේ නැපෝලියන් පරාජයට පත්වීම.

PAST PAPERS WIKI

(ලකුණු 08 යි)

**(ii) බොල්ෂෙවික් විප්ලවය**

- ❖ බොල්ෂෙවික් විප්ලවය ඇතිවූ පසුබිම: 1905 විප්ලවය; 1917 මාර්තු (පෙබරවාරි) විප්ලවය හා එහි ප්‍රතිඵලයක් ලෙස සාර් පාලනය පෙරලා දමා තාවකාලික ආණ්ඩුව බලයට පත්වීම.

- ❖ එම ආණ්ඩුව පළමුවන ලෝක යුද්ධයට දිගටම රුසියාව සහභාගී කරවූ අතර රට තුළ පැවති දේශපාලන-ආර්ථික ප්‍රශ්න විසඳීමට අසමත්වීම: මෙ නිසා ගොවි-කම්කරු අසහනය වර්ධනය වීම.

- ❖ සමාජවාදී ව්‍යාපාරය පෙරට පැමිණීම: ලෙනින් හා ට්‍රොට්ස්කිගේ නායකත්වය: 'සාමය, ඉඩම් හා ආහාර' යන සටන් පාඨය: පෙට්‍රොග්‍රෑඩ්හි හටගත් නැගීසිටීම: ලොව ප්‍රථම සමාජවාදී රාජ්‍යය බිහිවීම.

(ලකුණු 08 යි)

**(iii) ඉතාලියේ ෆැසිස්ට්වාදය**

- ❖ පළමුවන ලෝක යුද්ධයෙන් පසුව උද්ගත වූ තත්ත්වය:

පළමුවන ලෝක යුද්ධයේදී ඉතාලිය ජයග්‍රාහී පිලේ සිටි නමුත් යුද්ධාවසානයේදී බ්‍රිතාන්‍යය හා ප්‍රංශය තරම් වාසිදායක ප්‍රතිඵල අත් කරගැනීමට ඉතාලිය අසමත් වීම හා ඒ හේතුකොටගෙන ඉතාලිය තුළ හටගත් කලකිරීම හා විරෝධය.

- ❖ මෙ නිසා රට තුළ අර්බුදකාරී අරාජික වාතාවරණයක් නිර්මාණය වීම:

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාත්මක නොවීම; ආහාර හිඟය, මිල උද්ධමනය, විරැකියාව, ප්‍රචණ්ඩ වැඩවර්ජන, කම්කරුවන් විසින් කර්මාන්තශාලා අත්පත් කරගැනීම, ගොවීන් වගා නොකළ ඉඩම්වල බලහත්කාරයෙන් පදිංචි වීම ආදිය හේතුකොටගෙන පශ්චාත් යුධ සමයේ ඉතාලියේ නිර්මාණය වූ අර්බුදකාරී වාතාවරණය; සමාජවාදී ව්‍යාපාරයේ දුර්වලතා.

- ❖ බෙනිටෝ මුසෝලිනීගේ නායකත්වය:

  - ඉතාලි ෆැසිස්ට්වාදී නායකයාය.
  - මුලදී සමාජවාදියෙකු වූ මොහු පසුව 1919 දී ඉතාලි ෆැසිස්ට් පක්ෂය ආරම්භ කිරීම.
  - ඉන් පෙළපාලියකට පසු කළු කමිස හමුදාව සමග රෝමයට කඩා වැදී ඉතාලියේ බලය අල්ලාගැනීම.
  - ඉතාලියේ අගමැතිවරයා වශයෙන් ඒකාධිපති ප්‍රතිපත්ති අනුගමනය කිරීම.
  - ඔහු අනුගමනය කළ ෆැසිස්ට් වැඩපිළිවෙලට අනුව සියල්ල රාජ්‍යය යටත්ය.
  - 1943 දී පාලන බලය අත්හැරීමට සිදුවීම.
  - දෙවන යුද්ධය අවසන්වන්නට සති කීපයකට පෙරාතුව 1945 දී ඝාතනයට ලක්වීම.

(ලකුණු 08 යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iv) **එක්සත් ජාතීන්ගේ සංවිධානය**

❖ පසුබිම - 1945 අප්‍රේල් සිට ජූනි තෙක් පවත්වන ලද සැන්ෆ්‍රැන්සිස්කෝ සමුළුව (රටවල් 51ක නියෝජනය) මගින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස්කිරීම. ඒ මත පිහිටා 1945 ඔක්තෝබර් 24 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම (සැමරුම් දිනය).

❖ ව්‍යුහය: ප්‍රධාන ආයතන 6 කි

1) මහ සභාව 2) ආරක්ෂක මණ්ඩලය 3) ආර්ථික හා සමාජ මණ්ඩලය
4) භාරකාරත්ව මණ්ඩලය 5) මහ ලේකම් කාර්යාලය 6) ජාත්‍යන්තර අධිකරණය

❖ අරමුණු:

- ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම.
- ජාතීන් අතර මිත්‍රත්වය වර්ධනය කිරීම.
- ආර්ථික-සමාජ-සංස්කෘතික සහ මානුෂික පදනමකින් ප්‍රශ්න විසඳීම.
- මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් තහවුරු කිරීමෙහිලා ජාත්‍යන්තර සහයෝගය ලබාගැනීම.
- මෙම පොදු අරමුණු සපුරාගැනීම සඳහා ලෝක වේදිකාවක් ලෙස කටයුතු කිරීම.

❖ එක්සත් ජාතීන්ගේ සංවිධානය මිශ්‍ර සාර්ථකත්වයක් අත්පත් කරගෙන ඇතැයි කිව හැකිය. විශේෂයෙන් සාමය ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් එය ඇතැම් අවස්ථාවලදී සාර්ථකත්වයක් අත්පත්කරගෙන ඇත. කොංගෝවේ සිවිල් යුද්ධය, බටහිර නිව්ගිනියාව සම්බන්ධයෙන් ඕලන්දය හා ඉන්දුනීසියාව අතර ඇති වූ මතභේදය වැනි මහා බලවතුන් සෘජුවම සම්බන්ධ නොවූ අර්බුද සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සාම ප්‍රයත්න සාර්ථක වූ නමුත් මහා බලවතුන්ගේ අභිමතාර්ථ සමග ගැටුන අවස්ථාවල එම සාම ප්‍රයත්න සාර්ථක නොවිය.

❖ එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වූ කැපීපෙනෙන ලෝක අර්බුද කීපයක් පහත දක්වේ:

- 1946 ඕලන්ද පාලනයෙන් නැගෙනහිර ඉන්දියා දූපත්වලට නිදහස ලබාගැනීමට ආධාර කිරීම.
- පලස්තීනය තුළ යුදෙව්වන් හා අරාබීන් අතර ඇති වූ ගැටුම (පූර්ණ සාමයක් ඇතිකිරීමට අසමත්වීම).
- 1950-53 කොරියන් අර්බුදය.
- 1956 සූවස් අර්බුදය.
- 1956 හංගේරියානු ජනතා නැගී සිටීම.
- බෙල්ජියම්-කොංගෝ සිවිල් යුද්ධය.
- සයිප්‍රස් ප්‍රශ්නය
- කාශ්මීර ප්‍රශ්නය
- 1968 චෙකොස්ලෝවැකියානු අර්බුදය
- 1979 රුසියාව විසින් ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීම

**(ලකුණු 08 යි)**

****